# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.19 පැය 1600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/471/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් වංචනික ලෙස ලබාගැනීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය.**

රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් හිමි පත්වීම් ලබාගත් බවට ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර, සාපරාධී විශ්වාසය කඩකර සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් වංචනික ලෙස ලබාගැනීම සම්බන්ධයෙන් මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව ඉහත අපරාධයට ආධාර අනුබල දෙමින් කුමන්ත්‍රණය කිරීම සම්බන්ධව සැකකරුවන් 06 දෙනෙකු හා සැකකාරියන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකිරීමේදී ඉහත අත්අඩංගුවට ගන්නා ලද එක් සැකකාරියකගේ ස්වාමිපුරුෂයෙකු මෙම අපරාධයට ආධාර අනුබල දීමේ චෝදනාවට 2026.03.18 දින සවස් කාලයේ මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු 2026.03.19 දින මැදවච්චිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. මධ්‍යම අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

ஊழியர் சேம நிதியத்தில் சம்பள நிதி மோசடிக்கு உடந்தையாக இருந்த சந்தேக நபர் கைது – மத்திய குற்றவியல் விசாரணைப் பணியகம்.

அரசு சேவையிலிருந்து நிலையான ஓய்வூதியம் பெறுவதாக போலியான ஆவணங்களை சமர்பித்து, சம்பள நிதி மோசடி செய்வதில் குற்றவாளிகளின் நம்பிக்கையை குற்றவியல் நம்பிக்கை மோசடி செய்து நிதிகளை மோசடியாக பெற்றமை தொடர்பாக, மத்திய குற்றவியல் விசாரணைப் பணியகத்தில் வழங்கப்பட்ட முறைப்பாட்டின் அடிப்படையில் விசாரணை ஆரம்பிக்கப்பட்டுள்ளது.

இதன்படி, இந்த குற்றத்திற்கு உடந்தையாக இருந்த 06 சந்தேக நபர்கள் மற்றும் இரண்டு பெண்கள் கைது செய்யப்பட்டு, கௌரவ நீதிமன்றத்தில் முன்னிலைப்படுத்தியதன் பின்னர் விளக்கமறியலில் வைக்குமாறு உத்தரவிடப்பட்டுள்ளார்.

இக் குற்றம் தொடர்பாக மேலதிக விசாரணைகள் மேற்கொண்டு இவ்வாறு கைது செய்யப்பட்ட பெண் சந்தேகநபரின் கணவர் இக் குற்றத்திற்கு உடந்தையாக இருந்தமைக்கு குற்றம் சாட்டப்பட்டு 2026.03.18 ஆந் திகதி மாலை வேளையில் மத்திய குற்றவியல் விசாரணைப் பணியகத்தினால் கைது செய்யப்பட்டுள்ளார்.

சந்தேகக நபர் 32 வயதுடையவர் மெதவச்சிய பிரதேசத்தை சேர்ந்தவர்.

சந்தேக நபரை 2026.03.19 அன்று மெதவச்சிய நீதிவான் நீதிமன்றில் முன்னிலைப் படுத்தப்படவுள்ளார். மத்திய குற்றவியல் விசாரணைப் பணியகம் மேலதிக விசாரணைகளை மேற்கொண்டு வருகின்றது.

போலீஸ் ஊடக பிரிவு